SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

## අදියර I විභාගය - 2024 ජනවාරි

## යෝජිත උත්තර

# (103) ආර්ථික විද්‍යාව (ECN)


ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669


**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අදියර I විභාගය - 2024 ජනවාරි**

# (103) ආර්ථික විද්‍යාව

# යෝජිත උත්තර

(මුළු ලකුණු 40) **A කොටස**

## *පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

**1.1** (2)

**1.2** (4)

**1.3** (3)

**1.4** (1)

**1.5** (3)

**1.6** (1)

**1.7** (2)

**1.8** (1)

**1.9** (3)

**1.10** (2)

**1.11** ඒකාධිකාරී

**1.12** වැඩිවන

**1.13** අසත්‍ය

**1.14** සත්‍ය

**1.15**

ආර්ථික වර්ධනය යනු රටක මුර්ත දළ දේශීය නිෂ්පාදනය අඛණ්ඩව වැඩිවීමයි. එනම් භාණ්ඩ හා සේවා නිෂ්පාදන ධාරිතාවය හෙවත් විභව නිමැවුම අඛණ්ඩව ඉහළ යාමයි.

රටක ආර්ථික වෘද්ධිය මනිනු ලබන්නේ ආර්ථික වෘද්ධි අනුපාතය මගිනි.

**විකල්ප පිළිතුර :**

ආර්ථික වර්ධනය =

$$\frac{(\text{වත්මන් වසරේ මූර්ත දළ දේශීය නිෂ්පාදනය} - \text{පෙර වසරේ දළ දේශීය නිෂ්පාදනය}}{\text{පෙර වසරේ දළ දේශීය නිෂ්පාදනය}} \times 100$$

**1.16**

- කර්මාන්තය තුළ ආයතන විශාල සංඛ්‍යාවක් සිටීම.
- එක් එක් ආයතනය ප්‍රභේදනය කළ භාණ්ඩ නිෂ්පාදනය කිරීම
- කර්මාන්තය තුළට ප්‍රවේශ වීමට හෝ පිට වීමට බාධා නොතිබීම.
- ආයතනය මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වීම.
- සාධක සංචලතාවයට බාධා නොපැවතීම.
- ඒකාධිකාරී තරගකාරී ආයතන දිගු කාලයේ දී ප්‍රාමාණික ලාභ පමණක් ලැබීම
- එක් එක් ආයතන ප්‍රභේදිත භාණ්ඩ නිපදවීම නිසා භාණ්ඩ එක සමාන වුවත් ඒවා අතර යම් යම් අසමානකම් පවතින බවට පාරිභෝගිකයන් තුළ විශ්වාසයක් පවතින නිසා භාණ්ඩවල මිල වෙනස් කිරීමේ හැකියාවක් ඒකාධිකාරී තරගකාරී ආයතනයට ඇත.

**1.17**

- තැන්පතු භාර ගැනීම

  ඉල්ලුම් තැන්පතු, ඉතුරුම් තැන්පතු, කාලීන / ස්ථාවර තැන්පතු
- ණය සහ අත්තිකාරම් ලබා දීම.
- කෙටි කාලීන ණය

  අයිරා පහසුකම් මත ණය ලබා දීම, කාලීන ණය, කල් බදු ණය, බිල්පත් වට්ටම් කිරීම
- නියෝජිත සේවා සැපයීම. (පිළිපත් විකිණීම හා මිල දී ගැනීම)
- පොදු උපයෝගිතා සේවා සැපයීම

  උකස් සේවා සැපයීම, විදේශ විනිමය ගනුදෙනුවලට අවශ්‍ය පහසුකම් සැපයීම, විදේශ බැංකු කටයුතුවල දී සහාය සැපයීම, බැංකු අණකර, ණයපත් නිකුත් කිරීම.
- චෙක්පත් සහ බිල්පත් එකතු කිරීම
- ණයවර ලිපි නිකුත් කිරීම යොමු ලිපි නිකුත් කිරීම
- සංචාරක චෙක්පත් නිකුත් කිරීම
- ආරක්ෂිත ලොකර් පහසුකම
- නවීන පහසුකම්
- ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරුව
- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM)

aat SRI LANKA

**1.18** සැපයුම් නීතිය යනු යම් දෙන ලද නිශ්චිත අවස්ථාවක සැපයුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල සහ සැපයුම් ප්‍රමාණය අතර පවත්නා අනුලෝම (ධන) සම්බන්ධතාවයයි.

**1.19**

- සාධක සංචලන හැකියාව
- භාණ්ඩයේ ස්වභාවය
- තොග පවත්වාගෙන යාමේ හැකියාව
- මිල වෙනස්වීම හේතුවෙන් සැපයුම වෙනස් කිරීමට ගතවන කාලය
- නිෂ්පාදන පිරිවැය

**1.20**

- නවීකරණය වීම.
- නිෂ්පාදන ශිල්ප ක්‍රම හා තාක්ෂණය උසස් වීම.
- කාර්මිකරණය වේගවත් වීම.
- සම්පත් වල ඵලදායිතාවය ඉහළ යාම.
- දුගී බව, විරැකියාව අඩු වීම හා ආදායම් බෙදීයාමේ විෂමතාව ඉවත්වීම.
- නිෂ්පාදන අංශයන්හි ව්‍යුහාත්මක වෙනස්කම් සිදු වීම.

***(එක් කොටසකට ලකුණු 02 , මුළු ලකුණු 40 යි)***

aat SRI LANKA

***A කොටසෙහි අවසානය***

## දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**(a)**

- භූමිය
- ශ්‍රමය
- ප්‍රාග්ධනය
- ව්‍යවසායකත්වය

*(ලකුණු 02)*

**(b)**

- සම්පත්වල හිගකමක් නොමැති විට
- සම්පත්වල විකල්ප ප්‍රයෝජන නොමැති විට
- සේවා වියුක්ත සම්පත් සේවා නියුක්ත කිරීමේදී

*(ලකුණු 02)*

**(c)**

ආර්ථිකයක සම්පත් සීමිත නිසාත් , එම සීමිත සම්පත් වලින් සියලුම වුවමනාවන් සපුරාලිය නොහැකි නිසා සැම ආර්ථිකයක්ම මූලික අර්ථික ප්‍රශ්න තුනකට මුහුණ දේ.

- **කුමක් නිෂ්පාදනය කරනවද ?**

මෙමගින් අදහස් කරනුයේ හිග සම්පත් යොදාගෙන කවර භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරනවද යන්නයි. ආර්ථිකයක සම්පත් හිග නිසාත් හිග සම්පත්වල විකල්ප ප්‍රයෝජන පවතින නිසාත් සැම ආර්ථිකයක්ම මෙම ප්‍රශ්නයට මුහුණදෙනු ලබයි. කුමක් / කොපමණ නිපදවනවා ද යන්න තීරණය කොට ඒ සඳහා සම්පත් බෙදා වෙන් කිරීමක් සිදු වන නිසා කුමක් කොපමණ නිපදවනවා ද යන මූලික ආර්ථික ප්‍රශ්නය **සම්පත් බෙදා වෙන් කිරීමේ ප්‍රශ්නය** ලෙසින් ද හැඳින්විය හැකි ය.

- **කෙසේ නිෂ්පාදනය කරනවාද ?**

කවර නිෂ්පාදන ශිල්පක්‍රමයක් භාවිතා කරනවද? යන්න මෙමගින් අදහස් කරනු ලබයි. මෙහිදී ආර්ථිකයකට තෝරාගත හැකි විකල්ප ශිල්පිය ක්‍රම දෙකකි. ඒවා නම් ශ්‍රම සුක්ෂම ශිල්පිය ක්‍රමය සහ ප්‍රාග්ධන සුක්ෂම ශිල්පිය ක්‍රමයයි. විකල්ප නිෂ්පාදන ශිල්ප ක්‍රම අතරින් කුමන හෝ එක් නිෂ්පාදන ශිල්ප ක්‍රමයක් භාවිතා කොට නිපදවීමක් සිදුවන නිසා කෙසේ නිෂ්පාදනය කළ යුතු ද යන මූලික ආර්ථික ප්‍රශ්නය **නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය** ලෙසින් ද හැඳින්වේ.

- **කා සඳහා නිෂ්පාදනය කරනවාද ?**

නිපදවනු ලබන භාණ්ඩ සමාජයේ කවර කණ්ඩායමක් සඳහා ලබා දෙනවාද? යන්න මෙමගින් අදහස් කරනු ලබයි. එනම් හිග සම්පත් යොදා ගනිමින් නිෂ්පාදනය කරනු ලබන සීමිත

භාණ්ඩ හා සේවා ප්‍රමාණය සමාජයේ කවුරුන් විසින් හිමි කර ගනු ලැබේ ද? භුක්ති විඳිනු ලැබේ ද? යන්න මෙයින් අදහස් වේ.

මෙලෙසින් නිපදවන භාණ්ඩ ප්‍රමාණය භුක්ති විඳීම ඒ ඒ පුද්ගලයින්ගේ ආදායම මත තීරණය වන නිසා කා සඳහා නිපදවිය යුතු ද යන්න **ආදායම් බෙදී යාම පිළිබඳ ප්‍රශ්නය** ලෙසින් ද හැඳින්වේ.

*(ලකුණු 06)*
*(මුළු ලකුණු 10 යි)*

## තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**(a)**

Qd = 200 – 3P

Qs = - 100 + 2P

සමතුලිත මිල සහ ප්‍රමාණය

$$Qd = Qs$$

$$200 - 3P = -100 + 2P$$

$$\frac{-5P}{-5} = \frac{-300}{-5}$$

**P = රු 60 සමතුලිත මිල**

සමතුලිත ප්‍රමාණය ගණනය කිරීම

Qd = 200 – 3P

P = 60

Qd = 200 – 3 × 60

Qd = 200 – 180

Qd = 20 ඒකක

*(ලකුණු 03)*

**(b) (i)**

| ස්ථාවර සාධකය ඉඩම (අක්කර) | විචල්‍ය සාධකය (ශ්‍රමය) | මුළු නිෂ්පාදිතය [Total Product (TP) ඒකක | සාමාන්‍ය නිෂ්පාදිතය (AP ) | ආන්තික නිෂ්පාදිතය (MP) |
|---|---|---|---|---|
| 1 | 0 | 0 | **0** | **0** |
| 1 | 1 | 8 | **8** | **8** |
| 1 | 2 | 18 | **9** | **10** |
| 1 | 3 | 33 | **11** | **15** |
| 1 | 4 | 36 | **9** | **3** |

*(ලකුණු 04)*

**(ii)**

**මුළු නිෂ්පාදිතය (TP)**

මුලදී වැඩි වන වේගයකින් වැඩි වී, පසුව අඩු වන වේගයකින් වැඩි වී උපරිමයට පැමිණ අඩු වීමට පටන්ගනී.


**සාමාන්‍ය නිෂ්පාදිතය (AP)**

මුළු නිෂ්පාදිතය වැඩි වන විට සාමාන්‍ය නිෂ්පාදිතය උපරිමය කරා ඉහළ යන අතර මුළු නිෂ්පාදිතය අඩු වන වේගයකින් වැඩිවන විට සාමාන්‍ය නිෂ්පාදිතය පහල යයි .

**ආන්තික නිෂ්පාදිතය (MP)**

මුළු නිෂ්පාදිතය වේගයෙන් ඉහල යන විට ආන්තික නිෂ්පාදිතය උපරිමය කරා ඉහල යන අතර මුළු නිෂ්පාදිතය අඩු වන වේගයකින් ඉහළ යන විට ආන්තික නිෂ්පාදිතය පහළ ගොස් මුළු නිෂ්පාදිතය උපරිම වන විට ආන්තික නිෂ්පාදිතය ශුන්‍ය වී මුළු නිෂ්පාදිතය අඩුවන විට ආන්තික නිෂ්පාදිතය ඍණ අගයක් ගනී. සාමාන්‍ය නිෂ්පාදිත වක්‍රයේ උපරිම ලක්ෂ්‍ය ජේදනය කරමින් ආන්තික නිෂ්පාදන වක්‍රය පහලට ගමන් කරයි.

මෙය රූපසටහනක් ඇසුරින් පහත පරිදි ඉදිරිපත් කල හැකිය.




153

***I අදියර***

මුළු නිෂ්පාදිතය : වැඩි වන වේගයකින් වැඩි වේ

සාමාන්‍ය නිෂ්පාදිතය : උපරිමය කරා ඉහල යයි.

ආන්තික නිෂ්පාදිතය : ඉහළ ගොස් පහළ යයි .

***II අදියර***

මුළු නිෂ්පාදිතය : අඩු වන වේගයකින් වැඩි වේ.

සාමාන්‍ය නිෂ්පාදිතය : අඩු වේ.

ආන්තික නිෂ්පාදිතය : ශුන්‍ය කරා අඩු වේ.

***III අදියර***

මුළු නිෂ්පාදිතය : පහළ යයි

සාමාන්‍ය නිෂ්පාදිතය : පහළ යයි

ආන්තික නිෂ්පාදිතය : සෘණ වේ.

*(ලකුණු 03)*

*(මුළු ලකුණු 10 යි)*

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරː*

**(a)**

මුදල් ඉල්ලුම තීරණය කරණ සාර්ව ආර්ථික විචල්‍යන්

- මූර්ථ ආදායම
- පොළී අනුපාතය
- මිල මට්ටම
- අනාගත අපේක්ෂා
- ආයතනික සාධක
- මූල්‍ය වෙළෙඳපොළ නව්‍යතා

*(ලකුණු 03)*

**(b)**

මිල මට්ටම ඉහළ යාම ආර්ථිකයේ සාමාන්‍ය පොළී අනුපාතිකයේ වැඩි වීමක් ඇති කරන අතර මිල මට්ටමේ අඩුවීමක් ආර්ථිකයක සාමාන්‍ය පොළී අනුපාතිකයේ අඩුවීමක් ඇති කරයි.

*(ලකුණු 03)*

**(c)** උද්ධමනයට හේතු


1. ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය
2. පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය

SRI LANKA

- **ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය**

සමාහාර සැපයුමට වඩා සමාහාර ඉල්ලුම වැඩි වීම නිසා භාණ්ඩ හා සේවා වල පොදු මිල මට්ටම ඉහළ යාම ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය ලෙස හැඳින්වේ.

මෙය රූපසටහනක් ඇසුරින් පහත පරිදි ඉදිරිපත් කල හැකිය.




සමාහාර සැපයුම නොවෙනස්ව තිබියදී සමාහාර ඉල්ලුම AD සිට $AD_1$ දක්වා වැඩි වීම නිසා ආර්ථිකයේ පොදු මිල මට්ටම $P_0$ සිට $P_1$ ඉහල ගොස් ඇත.

ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය පැහැදිලි කිරීම සඳහා විකල්ප ප්‍රවේශ දෙකකි.

1. කේන්සියානු න්‍යාය
2. මුදල් ප්‍රමාණවාදය


- **පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය**

යෙදවුම් මිල හෙවත් පිරිවැය ඉහළ යාම නිසා පොදු මිල මට්ටම ඉහළ යාම පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය ලෙස හැඳින්වේ.

යෙදවුම් මිල ගනන් ඉහළ යාම, ඉන්ධන මිල ගණන් ඉහළ යාම, සැපයුම් කම්පන, කතිපයාදිකාරී ආයතන ලාභ වැඩි කිරීමට යාමෙන් පිරිවැය වැඩිවීම පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයට හේතු වේ.

මෙය රූපසටහනක් ඇසුරින් පහත පරිදි ඉදිරිපත් කල හැකිය.

aat SRI LANKA




සමාහාර ඉල්ලුම නොවෙනස්ව තිබියදී සමාහාර සැපයුම AS සිට $AS_1$ දක්වා වැඩි වීම නිසා ආර්ථිකයේ පොදු මිල මට්ටම $P_0$ සිට $P_1$ ඉහල ගොස් ඇත.

*(ලකුණු 04)*

*(මුළු ලකුණු 10 යි)*

## *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

**(a) ධනාත්මක බලපෑම්**

1. ජාතික ආරක්ෂාවට සඳහා වැදගත් වීම - ජාතික ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය කර්මාන්ත සහ සම්පත් ආරක්ෂා කිරීම, තීරණාත්මක අංශවල ස්වයංපෝෂිතභාවය සහතික කිරීම සඳහා වෙළෙඳ බාධක ක්‍රියාත්මක කළ හැකිය.

2. ගෙවුම් ශේෂ දුෂ්කරතා විසඳීමට උපකාර වීම - ආනයන සීමා කිරීම, වෙළඳ බාධක මගින් වෙළඳ හිඟය අවම කර රටේ ගෙවුම් ශේෂය ස්ථාවර කර එමගින් සමස්ත ආර්ථික ස්ථාවරත්වය වැඩි දියුණු කළ හැක.

3. දේශීය ළදරු කර්මාන්ත ආරක්ෂා කිරීම - වෙළඳ බාධක නැගී එන කර්මාන්ත සඳහා ආරක්ෂිත පලිහක් සපයන අතර ඒවා සංවර්ධනය කිරීමට සහ ගෝලීය වෙළඳපොලේ තරඟකාරී වීමට ඉඩ සලසයි. එමඟින් ආර්ථික වර්ධනය සහ විවිධාංගීකරණය ප්‍රවර්ධනය කරයි.

4. දේශීය රැකියා ආරක්ෂා කිරීම වැදගත් වීම - විදේශ තරඟකාරීත්වයෙන් කර්මාන්ත ආරක්ෂා කිරීම මගින් දේශීය රැකියා ආරක්ෂා කිරීමට වෙළඳ බාධක උපකාරී වේ, එමඟින් රැකියා මට්ටම් පවත්වා ගෙන යාම සහ රැකියා අහිමි වීම් වළක්වා ගත හැකිය.

5. හානිකර භාණ්ඩ ආනයනය වැලැක්වීම - ජනගහනයේ යහපැවැත්ම ආරක්ෂා කරමින් මහජන සෞඛ්‍ය, ආරක්ෂාව හෝ පරිසරයට අවදානමක් ඇති කරන භාණ්ඩ ආනයනය නියාමනය කිරීමට වෙළඳ බාධක භාවිතා කළ හැකිය.

6. දේශීය සම්පත් භාවිතය වැඩි කිරීම - ආනයන සීමා කිරීම මගින්, වෙළඳ බාධක දේශීය සම්පත් භාවිතය දිරිමත් කිරීම සහ දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම හා ආර්ථික සංවර්ධනයට මග පාදයි.

SRI LANKA

**ඍණාත්මක බලපෑම්**

1. උසස් තාක්ෂණයේ සංක්‍රමණයට බාධා කිරීම - දේශීය කර්මාන්ත තුළ තාක්ෂණික ප්‍රගතියට හා නවෝත්පාදනයට බාධා කරමින්, විදේශ වෙළෙඳපොළෙන් උසස් තාක්ෂණ සහ නවෝත්පාදනයන් වෙත ප්‍රවේශ වීම සීමා කිරීමට වෙළෙඳ බාධකවලට හැකිය.

2. උසස් තත්ත්වයේ භාණ්ඩ නිෂ්පාදනය අඩු වීම - සම්බාධක හේතුවෙන් තරඟකාරීත්වය සහ නව්‍යකරණයන් අඩු වීම ඇති විය හැකි අතර, නිෂ්පාදකයින්ට තරගයක් නොමැති නිසා වැඩිදියුණු දේශීයව නිෂ්පාදනය කරන භාණ්ඩවල ගුණාත්මක භාවය පහත වැටීමට හේතු විය හැක.

3. දේශීය හා විදේශීය වෙළෙඳපොළ හැකිලීම හේතුවෙන් ජාතික ආදායම අඩුවීම - වෙළෙඳ බාධක දේශීය හා විදේශීය වෙළෙඳපොළ හැකිලීමට හේතු විය හැකි අතර, අපනයන හා ආනයන අඩුවීමට තුඩු දෙන අතර එමගින් ජාතික ආදායමට සහ ආර්ථික වර්ධනයට අහිතකර ලෙස බලපෑ හැකිය.

4. අකාර්යක්ෂම කර්මාන්ත ඇති විය හැකිය - ආරක්ෂණවාදී ප්‍රතිපත්ති මගින් ජාත්‍යන්තර තරඟකාරීත්වයෙන් ආරක්ෂා වන අකාර්යක්ෂම කර්මාන්ත සංවර්ධනයට හේතු විය හැක. එහි ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදන පිරිවැය ඉහළ යාම සහ දිගු කාලීනව තරඟකාරීත්වය අඩු වේ.

*(ලකුණු 03)*

**(b) රටක මුදලේ අගය ක්ෂය වීමේ අවාසි**

- ආනයනවල දේශීය මිල ගණන් ඉහළ යෑම.
- පෙරට වඩා ආනයන වියදම් ඉහළ යෑම.
- දේශීය ඉල්ලුම ආනයන මත රඳා පවතීනම් දේශීය උද්ධමනය ඉහළ යාම.
- විදේශීය ණය වාරික සහ පොළී ගෙවීම් ඉහළ යෑම.

*(ලකුණු 03)*

**(c)**

| රට | තිරිඟු (කිලෝග්‍රෑම් ) | සහල් (කිලෝග්‍රෑම් ) |
|---|---|---|
| ආජන්ටිනාව | 12/ 24 = 0.5 | 24/12=2 |
| චීනය | 8/4 = 2 | 4/8 = 0.5 |

සාපේක්ෂ වාසිය හදුනා ගැනීම සඳහා ඒ ඒ භාණ්ඩ නිෂ්පාදනයේ අවස්ථික පිරිවැය ගණනය කළ යුතුය

$$\text{තිරිඟු නිෂ්පාදනයේ අවස්ථික පිරිවැය} = \frac{\text{කැපකරන සහල් ඒකක ප්‍රමාණය}}{\text{වැඩි කරන තිරිඟු ඒකක ප්‍රමාණය}}$$

$$\text{ආජන්ටිනාව තිරිඟු නිෂ්පාදනයේ අවස්ථික පිරිවැය} = -\frac{12}{+24} = -0.5$$

aat SRI LANKA

චීනය තිරිඟු නිෂ්පාදනයේ අවස්ථික පිරිවැය $= \frac{-8}{+4}$

$= -2$

- මේ අනුව තිරිඟු නිෂ්පාදනයේ අඩු අවස්ථික පිරිවැය ආජන්ටිනාව සතුය (0.5 < 2). එමනිසා තිරිඟු නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය ආජන්ටිනාව සතුය

සහල් නිෂ්පාදනයේ අවස්ථික පිරිවැය $=$ $\frac{\text{කැපකරන තිරිඟු ඒකක ප්‍රමාණය}}{\text{වැඩි කරන සහල් ඒකක ප්‍රමාණය}}$

ආජන්ටිනාව සහල් නිෂ්පාදනයේ අවස්ථික පිරිවැය $= \frac{-24}{+12}$

$= -2$

චීනය සහල් නිෂ්පාදනයේ අවස්ථික පිරිවැය $= \frac{-4}{+8}$

$= -0.5$

- මේ අනුව සහල් නිෂ්පාදනයේ අඩු අවස්ථික පිරිවැය චීනය සතුය (0.5 < 2). එමනිසා සහල් නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය චීනය සතුය.

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10 යි)***

aat SRI LANKA

**B කොටසෙහි අවසානය**

(මුළු ලකුණු 20 යි)

**C කොටස**

## හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**පරිච්ඡේදය -**

**(A)**

**(a) ජාතික ආදායම් ගිණුම්වල පවත්නා සීමා**

- නොවිධිමත් ආර්ථිකය තුළ සිදුවන ඵලදායී නිෂ්පාදන ඇතුළත් නොවීම.
- ගෘහනියන් විසින් සපයනු ලබන සේවාවන් ජාතික නිෂ්පාදනයට ඇතුළත් නොකිරීම.
- යැපුම් ආර්ථික කටයුතු ජාතික ගිණුම් තුළ ඇතුළත් නොවීම.
- රාජ්‍ය ණය පොළී ජාතික ගිණුම් ගණනය කිරීමට දායක කර නොගැනීම.
- නිෂ්පාදනය නිසා පරිසරයට සිදුවන හානිය ජාතික ගිණුම් තුළ ඇතුළත් නොවීම.
- රාජ්‍ය සේවාවල ඇති වන වෙනස් වීම සලකා නොසලකා හැරීම..
- යුධ හා ආරක්ෂණ කටයුතු සඳහා දරන වියදම් ඵලදායි වියදම් ලෙස සැලකීම.
- රාජ්‍ය සේවාවන්හි ඵලදායිතාවයේ වෙනස්කම් සැලකිල්ලට නොගැනීම.

*(ලකුණු 03)*

**(b)**

ගැනුම්කරුවා (පාරිභෝගිකයා) සත්‍ය වශයෙන්ම භාණ්ඩ හා සේවා සඳහා ගෙවන මිල ගැනුම්කරුගේ මිල ලෙස හැඳින්වේ. නිෂ්පාදකයාගේ මිලට අතිරේකව ප්‍රවාහන ගාස්තු, වෙළඳ ආන්තිකයන් සහ ගැනුම්කරු විසින් ගෙවිය යුතු ශුද්ධ බදු ඇතුලත් කොට ගැනුම්කරුගේ මිල සකස් කරයි.

ගැනුම්කරුගේ මිල = නිෂ්පාදකයාගේ මිල + අතරමැදියන් විසින් අය කරනු ලබන වෙළඳ තීරු ගාස්තු සහ ප්‍රවාහන ගාස්තු + පාරිභෝගිකයින්ගෙන් අය කරනු ලබන භාණ්ඩ මත බදු - රජය විසින් පාරිභෝගිකයින් වෙනුවෙන් වෙළෙන්දාට ලබා දෙන සහනාධාර

*(ලකුණු 03)*

**(B)**

**(i)**

| **අයිතමය** | | **රු. මිලියන** |
|---|---|---|
| 1. පෞද්ගලික පරිභෝජන වියදම | = | 2000 |
| 2. රජයේ පරිභෝජන වියදම | = | 6500 |
| 3. දළ දේශිය ප්‍රාග්ධන සම්පාදනය | = | 5200 |
| 3.1 දළ දේශිය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය රු. මිලියන 2500 | | |
| 3.2 තොග වෙනස්වීම රු. මිලියන 2700 | | |
| **වෙළෙඳපොළ මිළට දළ දේශිය වියදම (GDE) 1 + 2 + 3** | = | <u>13700</u> |

*(ලකුණු 05)*

(ii)

| අයිතමය | | රු. මිලියන |
|---|---|---|
| 1. වෙළෙඳපොළ මිළට දළ දේශිය වියදම | = | 13700 |
| 2. එකතු කලා : භාණ්ඩ හා සේවා අපනයන | = | 7600 |
| අඩු කලා : භාණ්ඩ හා සේවා ආනයන | = | (9900) |
| **වෙළෙඳපොළ මිලට දළ දේශිය නිෂ්පාදිතය (GDP)** | = | 11400 |

*(ලකුණු 03)*

(iii)

| අයිතමය | | රු. මිලියන |
|---|---|---|
| 1. වෙළෙඳපොළ මිලට දළ දේශිය නිෂ්පාදිතය (GDP) | = | 11400 |
| 2. එකතු කලා : විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | = | 500 |
| **වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම (GNI)** | = | 11900 |

*(ලකුණු 02)*

(C)

- වැඩිවන බදු අනුපාත වැඩ කරන පුද්ගලයින්ට බදු ගෙවීමෙන් පසු ආදායම අඩු කරයි
- ආයෝජන ආදායම ඉහළ අනුපාත යටතේ විවිධ බදු වලට යටත් වන බැවින් වැඩිවන බදු අනුපාත පුද්ගලයන්ගේ සහ ව්‍යාපාරවල ඉතුරුම් සහ ආයෝජන අධෛර්යමත් කරයි.
- භාණ්ඩ හා සේවා මිල ඉහළ යයි
- ආදායම් බදු වැඩිවීම නිසා පුද්ගලයන්ගේ ජීවන තත්ත්වයට බලපෑම් ඇති විය හැක
- වැට් බදු ප්‍රතිපත්තියේ වෙනස්කම් ව්‍යාපාරවල පිරිවැය වැඩි කරන අතර එම නිසා ව්‍යාපාර බදු පැහැර හැරිය හැක
- නිෂ්පාදන පිරිවැය ඉහළ යාම හේතුවෙන් භාණ්ඩවල මිල වැඩි වන අතර එය අඩු ආදායම්ලාභී පාරිභෝගිකයින්ට බලපානු ඇත.

*(ලකුණු 04)*
*(මුළු ලකුණු 20 යි)*

***C කොටසෙහි අවසානය***

***Notice:***

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*